**ජාතික අධ්‍යාපන ආයතනය - 2018**

**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී  අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.  කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිත අංක 02 අනුව පිළියෙල කළ යුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පාරිතෝෂික ගෙවීම් වටිනාකම රු.5,547,436 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර කාරක ප්‍රග්ධන වෙනස්වීම් තුල උපචිත වියදම් වැඩිවීම් 3,026,822 කින් වැඩියෙන් දක්වා තිබුණි.එසේම මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.64,483,552 ක් වුවද එය රු.61,456,730 ක් ලෙස රු.3,026,822 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 වර්ෂයේ ගෙවන ලද පාරිතෝෂික මුදල ගණනය කිරීමේ දී පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට හර කරන ලද ජ'නල් සටහන් අංක 48 මගහැරී ගණනය කිරීම හේතුවෙන් සිදු වී ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බවත් උපචිත වියදම් වැඩිවීම වැඩියෙන් දක්වා තිබීම නිවැරදි කිරීමට කටයුතු කරන බවත්.<br><br>අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ශේෂයන් එකතු කිරීමේදී Bond Violation Fund යටතේ දක්වා ඇති රු.3,026,822 ක වටිනාකම මගහැරී ඇති නිසා මෙම වෙනස ඇති වී තිබෙන අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) ප්‍රමිත අංක 03 හි 47 (ආ) වගන්තිය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වල වැරදි , ඒවා සොයා ගැනීමෙන් පසුව වත්කම් හා වගකීම් වල ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් | 2019 වර්ෂය සඳහා ආරම්භක ශේෂ ඇතුළත් කිරීමට පෙර විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| අතීතානුයෝගිව නිවැරදි කල යුතු වුව ද ආයතනයේ පෙර වර්ෂ වල වැරදි සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) ප්‍රමිත 07 හි 47 වන වගන්තිය ප්‍රකාරව වත්කමක සාධාරන අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට ප්‍රත්‍යාගණනයක් සිදු කළ යුතු වුවද ආයතනයේ වත්කම් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු ආරම්භක කර ඇති බවත් 2019 ජූලි මස මෙම කාර්යය අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත් | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.10,000,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර 2018 වර්ෂය සඳහා ලැබුණු රු.58,000,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | 2017 දෙසැම්බර් 31 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබු රු.10,000,000 ක මුදල 2018 ජනවාරි මස බැංකු ගිණුමේ සටහන් වී ඇත.එබැවින් එම මුදල 2018 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත වී ඇත.එය 2019 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරන බවත් 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.58,000,000 ක මුදල බැංකු ගිණුම් විස්තරයේ ඇත්තේ 2019 වර්ෂයේ ජනවාරි මාසයේ බැවින් 2018 වර්ෂයේ ගිණුම් වලින් | වර්ෂයේ ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| | අත්හැරී ඇති අතර මෙම දෝෂය 2019 වර්ෂයේ ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | |
| (ආ) 2018 දෙසැම්බර් 31 දින ආයතනයේ එක් ජංගම ගිණුමකින් තවත් ජංගම ගිණුමකට රු.6,000,000 ක් මාරු කර තිබුණු අතර එහිදී ගිණුමට මුදල් එකතු වීමට අදාළ ගිණුම් සටහන තබා තිබුණ ද මුදල් අඩු වීමට අදාල ගිණුම් සටහන තබා නොතිබුණි. | 2018.12.31 දින ජංගම ගිණුම් අංක 607628 න් ජංගම ගිණුම් අංක 607624 ට රු.මි.6 ක් මාරු කරන ලදී.එහි දී බැර සටහන පමණක් Transfer of Funds ගිණුමට සටහන් කර ඇතත් හර සටහන ඇතුළත් නොවීම හේතුවෙන් 2018.12.31 දිනට මුදල් ශේෂය රු.මි.6 ක් වැඩියෙන් පෙන්වීම නිවැරදි කිරීම සඳහා අදාළ සටහන යොදන ලස බව | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.7,245,228 ක භාණ්ඩාගාර බිල්පත් පොලිය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සටහන් කිරීම හා ලැබිය යුතු පොලී ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් හා අධිභාර මුදල රු.68,757,867 ක් වුවද ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් වටිනාකම රු.72,168,213 ක් ලෙස රු.3,172,820 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි. | ගෙවිය යුතු නිවැරදි සේවක අර්ථසාධක අරමුදල් හිඟ දායක මුදල රු.68,757,867 ක් වන අතර එම වටිනාකම ගිණුම් වල දැක්වීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂයේ ලැබුණු පුනරාවර්තන මුදල් ප්‍රදාන රු.5,000,000 ක් ප්‍රාග්ධන ලැබීමක් ලෙස සටහන් කිරීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය හා ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි. | 2018 ජූනි මස ලැබුණු පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් යන වියදම් දෙක ම එකම ලැබීමක් ලෙස බැංකුවට බැර වී ඇත.එබැවින් මුළු මුදලම ප්‍රාග්ධන ලැබීම් ලෙස ගිණුම් ගත වී ඇත.මෙම දෝෂය 2018 මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වැරදි නිවැරදි කිරීම් යටතේ නිවැරදි කරනු ලබන බව. | නිවැරදිව ගිණුම් ගත කිරීමට පියවර ගත යුතුය |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) සමුච්චිත අරමුදල් ගිණුමේ සහ තොග ගිණුමේ ආරම්භක ශේෂ පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පැවති අවසන් ශේෂ සමඟ නොසැසඳීම | 158.58 | 230.96 | 72.38 | පරිගණක මෘදුකාංගයේ ආරම්භක ශේෂ ඇතුළත් කිරීමේ දී ඇති වූ ගැටලුවක් හේතුවෙන් මෙය සිදු වී ඇති බව. | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) සමුච්චිත අරමුදල් ගිණුමේ සහ බැඳීම් උල්ලංගණය කිරීමේ ගිණුමේ අවසාන ශේෂ මූල්‍ය ප්‍රකාශන වල ශේෂ සමඟ නොසැසඳීම | 66.72 | 212.71 | 145.99 | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව | නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | තොග ගිණුමේ ශේෂය උපලේඛනයේ සඳහන් ශේෂය සමඟ නොසැසඳීම | 48.96 | 49.70 | 0.74 | තොග ගිණුමේ ලෙජරයට අනුව ශේෂය නිවැරදිය. උපලේඛනය සකස් කිරීමට අදාළ තොරතුරු පරිගණක ගත කිරීමේ දී සිදුවූ දෝෂයක් උපලේඛනයේ වෙනසට හේතු වී ඇති බව | මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂය හා උපලේඛන වල ශේෂය සමාන විය යුතුය. |

## 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විෂය** | **මුදල** | **නොසැපයූ විගණන සාක්ෂි** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | | | |
| පුස්තකාල පොත් | 45.03 | 2008 වර්ෂයට පෙර ආරම්භක ශේෂය ලෙස ඇති මෙම පුස්තකාල පොත් සඳහා උපලේඛණයක් | අදාළ පොත් තොගයෙහි අන්තර්ගතය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ඉක්මනින් සකස් කර ඒ අනුව උපලේඛනයක් සකස් කර ගැනීමට අපේක්ෂා කරන බව | මෙම පුස්තකාල පොත් ශේෂය ගණනය කර වටිනාකම ගිණුම් වල ඇතුළත් කිරීම සඳහා කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ ණය ගැති ශේෂය තුළ ඇති වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පැවති රු.346,040 ක ශේෂය ප්‍රවර්ථන වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවීමට ඇති ණය ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.28,187,054 ක ගෙවිය යුතු තැන්පතු තුල වර්ෂ 5 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.8,417,315 ක තැන්පතු පැවති අතර එම තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර 5 ඉක්මවා ඇති මුදලින් රු.1,713,497 ක් ගෙවීමට සිදුවන බව තහවුරු වී ඇති බැවින් තව දුරටත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා ඇත.විවිධ ණය හිමියන් යටතේ වන, වසර 5 ඉක්ම වූ ශේෂ පරීක්ෂා කර බලා 2019 වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු කරනු ලබන බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ)ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය 6.1 වගන්තිය | අතිකාල ගෙවීම් රේට ගණන් බැලිය යුත්තේ මාසික ඒකාබද්ධ වැටුප (දීමනා හැර) පදනම් කර වුවත් 1995 මාර්තු 22 දිනැති අංක ඩි/එස්/811/617/94 දරන සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු ගේ උපදෙස් ලිපියක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට දළ වැටුප පදනම් කරගෙන අතිකාල දීමනා ගණනය කර තිබුණු අතර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2016 හා 2017 වර්ෂ සඳහා හිඟ අතිකාල දීමනා ලෙස රු.27,301,283 ක් ද 2018 වර්ෂයට අදාල අතිකාල දීමනා සඳහා | ජාතික අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුතු අතිකාල දීමනා හිමිකම් ලැබීමට අයත් කාර්ය මණ්ඩලයට අතිකාල දීමනා ගෙවීමේ දී 1995.03.22 දින සහකාර කම්කරු කොසමාරිස්වරයා විසින් දෙන ලද නියෝගය මත ජීවන වියදම් දීමනාව ඇතුළත් කරමින් මාසික පාරිශ්‍රමිකය ගණනය කර පැයකට පැය 1 1/2 වශයෙන් අතිකාල ගෙවීම් කර ඇති බවත් කම්කරු කොමසාරිස් විසින් 1995.03.22 දින හා 2018.08.01 දින ලබා දී ඇති නියෝග අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ අනුමැතිය ලබා ගෙන අතිකාල දීමනා ගෙවීම් කර ඇති බව | දළ වැටුප මත අතිකාල දීමනා ගෙවීම සඳහා විධිමත් භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.59,593,538 ක් ද වශයෙන් එකතුව රු.86,894,821 ක මුදලක් ප්‍රවර්ථන වර්ෂයේදී ගෙවා තිබුණි. | | |
| (ආ) 2018 මාර්තු 19 දිනැති 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව රජයේ ආයතන විසින් අලෙවි කරනු ලබන රථ වාහන වල අලෙවි වටිනාකම රජයේ ඒකාබද්ධ අර මුදලට බැර කල යුතු වුවත් මෙම වාහන අලෙවියෙන් ලද රු.2,524,000 ක මුදල එසේ කර නොතිබුණි. | 2018 මාර්තු 19 දිනැති 01/2018 දරණ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාහන විකිණීමෙන් ලද මුදල වන රු.2,524,000 ක් ඉතා ඉක්මනින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට හා ඒ අනුව ගිණුම් වල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ)භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2013 වර්ෂයේදී අනුමත කර ඇති අංක 257 දරන චක්‍රලේඛය | ආයතනයේ නිලධාරීන්ගේ වැටුපට අමතරව උපයන ඉපයීම් ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුපෙන් සියයට 50 නොඉක්මවිය යුතු වුවත් ඊට පටහැනිව 2014 සිට 2017 වර්ෂය දක්වා නිලධාරින් 48 දෙනෙකුට රු.4,501,586 ක් ද 2018 වර්ෂයේදී ද නිලධාරින් 37 දෙනෙකුට | ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්යය භාරය විශ්ව විද්‍යාලයකට සමානුපාතිකව පවතින අතර බඳවා ගැනීමේ අපහසුතා ද පවති.එබැවින් ආයතනයට සරිලන වැටුප් ප්‍රමාණය අනුමත කර ගැනීමට ඉදිරිපත් කර ඇති නමුත් ඒ සඳහා ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ ජාතික අයවැය යෝජනාවලියට සරිලන වැටුප් ක්‍රමයක් යෝජනා කර ඇත.එය මේ දක්වා ක්‍රියාත්මක නොවූ බවත් මේ හේතුවෙන් ඉදිරි අධ්‍යයන කාර්යයන් වල දී සෙනසුරාදා , ඉරිදා හා නිවාඩු දිනවල ආයතනයේ | චක්‍රලේඛ ප්‍රකාරව ගෙවීම් කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| රු.3,185,113 ක් ද දීමනා වශයෙන් ගෙවා තිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලය සේවය සඳහා පැමිණීමට අකමැත්ත දක්වන අතර ඔවුන්ගේ සේවය නොමැතිව බාහිර සම්පත් පුද්ගලයින් ද සේවයට යොදවා ගත නොහැකි බැවින් ආයතනය බලවත් අර්බුදයකට මුහුණපානු ඇති බවත් මෙම කරුණු හේතුවෙන් මූලික වැටුපෙන් සියයට 50 උපරිම සීමාව තුළ ගණනය කිරීමේදී ගැටළු මතු වී ඇති බවත් මුදල් දෙපාර්තමේන්තුව විසින් එක් එක් නිලධාරියා වෙතින් අයවිය යුතු මුදල් ගණනය කිරීම් සිදු කර ඇති අතර ඒ පිළිබඳ එක් එක් නිලධාරියා වෙත දැනුම් දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් නිලධාරීන්ගේ එකඟතාවය මත කොටස් වශයෙන් අය කිරීමට කටයුතු කරන බවත්. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.21,197,788 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.155,052,077 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.133,854,289 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම් රු.88,134,612 කින් වැඩි වීම හා තැන්පතු ආදායම් රු.284,293,622 කින් සහ පාඨමාලා සහ විභාග ගාස්තු ආදායම රු.222,470,001 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2017 වර්ෂයේ රු.313,670,037 ක් වූ තැන්පතු ආදායම් 2018 වර්ෂයේ රු.29,376,415 දක්වා සියයට 91 කින් අඩු වී තිබුණු අතර 2017 වර්ෂයේ රු.320,987,832 ක් වූ පාඨමාලා සහ විභාග ගාස්තු ආදායම 2018 වර්ෂයේදී 98,517,831 දක්වා සියයට 69 කින් අඩු වී තිබුණි. එසේම 2017 වර්ෂය රු.334,569,148 ක් වූ පුද්ගල පඩිනඩි සඳහා වියදම් 2018 වර්ෂයේදී 389,670,485 ක් දක්වා සියයට 16 කින් වැඩි වී තිබුණු අතර 2017 වර්ෂයේ රු.56,694,055 ක් වූ මෙහෙයුම් වියදම් 2018 වර්ෂයේදි රු.96,751,898 ක් දක්වා සියයට 71 කින් වැඩිවී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 3.7:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 3.5:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 3.5:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 3.3:1 ක් ව පැවතුණි. ජංගම වත්කම් වලින් සියයට 80 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැදුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂ වන අතර ඒ අනුව ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුද්‍රණාලයේ වසර 30 කටත් වඩා පැරණි යන්ත්‍ර සූත්‍ර වූ අතර ඩිජිටල් වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයක් ඇතුළු අයිතම 12 ක අවශ්‍යතාවය පැවතිය ද ඔෆ්සෙට් යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා 2017 මාර්තු 20 දින රු.74,370 ක් වැය කර පුවත් පත් දැන්වීමක් එල කර තිබූ නමුත් එම යන්ත්‍රය ද මිලදී | මුද්‍රණාලයේ තිබෙන මුද්‍රණ යන්ත්‍ර වසර 30 කට වඩා පැරණි බැවින් නවීණ මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීමට අවශ්‍ය පිරිවිතර සකස් කර ඇගයීම් කර ප්‍රසම්පාදන අංශයට ලබා දී ඇතත් එක් ආයතනයකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ නිසා ප්‍රසම්පාදන කමිටුව එය | ආයතනයේ මුද්‍රණාලය ඵලදායීව භාවිතා කල යුතුය. |

| | | |
|---|---|---|
| ගෙන නොතිබුණු අතර 2018 වර්ෂයේදී අතිකාල දීමනා ලෙස රු.5,445,741 ක් මුද්‍රණාලයේ සේවකයන්ට ගෙවා තිබියදීත් මුද්‍රණ කටයුතු බාහිර පොත් මුද්‍රණ ආයතන මගින් ඉටු කරගෙන ඒ සඳහා රු.9,129,735 ක මුදලක් ගෙවා තිබුණි. | ප්‍රතික්ෂේප කර ඇති බවත් මුද්‍රණාලයට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන්ගේ හිගය නිසාත් මෙහි ඇති යන්ත්‍ර ඉතා පැරණි ඒවා නිසාත් ලැබෙන මුද්‍රණ ඇණවුම් , ප්‍රමාණයෙන් විශාල වන නිසාත් ජාතික අධ්‍යාපන ආයතනයේ මුද්‍රණාලයට සියලුම ඇණවුම් මුද්‍රණය කළ නොහැකි බව හා ආයතනයේ මුද්‍රණ කාර්යන්හි අවශ්‍යතාවය මත මුද්‍රණාලය මගින් උපරිම ධාරිතාවෙන් එම කාර්යයන් ඉටු කරන අතර ඉතිරි ඒවා බාහිර ආයතන වලට ලබා දී ඉටු කර ගැනීමට සිදු වූ බව. | |
| (ආ) මුද්‍රණ කටයුතු සඳහා 2018 වර්ෂයට අදාළව වැඩ 243 ක් විවිධ අංශ විසින් ලබා දී තිබුණු අතර ඉන් වැඩ 25 ක් 2018 වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.එසේම 2018 වර්ෂය තුළ මුද්‍රණාලය මගින් නිම කර තිබුණු වැඩ 272 ක ප්‍රමාණයෙන් වැඩ 54 ක් 2014,2016 සහ 2017 වර්ෂ වලට අදාළ කාර්යයන් වූ අතර මුද්‍රණ කටයුතු කිරීම සඳහා සැලසුම් සකස් කර ඒවා නියමිත කාල සීමා වලදී සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | මුද්‍රණය සඳහා විවිධ දෙපාර්තමේන්තු මගින් 2018 වර්ෂයේ දී ඇණවුම් 243 ක් ලබා දී තිබූ අතර පුහුණු යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ හිඟකම සහ වසර 30 ක් පමණ පැරණි මුද්‍රණ යන්ත්‍ර භාවිතා කර එයින් ඇණවුම් 197 ක් නිම කර ඇති බවත් මෙම යන්ත්‍ර වරින් වර අලුත්වැඩියා කිරීමට සිදුවන බැවින් ලබා දී ඇති ඇණවුම් සැලසුම් කළ පරිදි ඉටු කළ නොහැකි වී ඇති අතර මෙයට අමතරව පුහුණු යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ හිඟකම ද විශාල ලෙස බලපා ඇති බව. | මුද්‍රණ කටයුතු නියමිත කාලය තුල සම්පූර්ණ කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එම සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක කර නොතිබුණු අවස්ථා තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු 3 ක් මගින් විෂයයන් 4 ක් සඳහා ගුරු මාර්ගෝපදේශ අත්පොත් සකස් කිරීම සඳහා සැලසුම්කර තිබුණද විෂයයන් 03 ක් සඳහා ගුරු මාර්ගෝපදේශ අත්පොත් සකස් කර නොතිබු අතර විෂයයන් 07 කට අදාල සම්පත් දායක පොත් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද විෂයයන් 06 කට අදාල සම්පත් දායක පොත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සකස් කර නොතිබුණි.ඉන් විෂයයන් 04 කට අදාළ සම්පත් දායක පොත් 2017 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කල පොත් විය. | 06 ශ්‍රේණිය සිංහල දෙවන බස වැඩ පොත මුද්‍රණය කරමින් පවතින බවත් විෂයය නිර්දේශය කිහිප අවස්ථාවකදී සංශෝධනය කිරීමට සිදු වීම නිසා 13 ශ්‍රේණිය සිංහල ගුරුඅත්පොත සඳහා 2018 අප්‍රේල් 19 දින ආයතන සභා අනුමැතිය ලබාගත් බවත් 2019 මැයි 03 දින පෙරටු පිටපත ලැබී ඇති බව සහ 12 ශ්‍රේණියේ පාරිභාෂික ශබ්ද මාලාව හා ගෘහ ආර්ථික විද්‍යාව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංග්‍රහය 2019 ජූනි මාසයේ දී ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇති බව | සැලැසුම් කරන ලද පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) ආයතනය විසින් 2018 වර්ෂයේදි විභාග 20 ක් පවත්වා තිබුණු අතර විභාග 09 ක ප්‍රතිඵල විගණිත දිනය වූ 2019 මාර්තු 31 වන විටත් | අවසාන ලිඛිත විභාගය , විභාග දෙපාර්තමේන්තුව මගින් ද අනෙක් ඇගයීම් අදාළ දෙපාර්තමේන්තු මගින් ද සිදු කෙරේ.මෙම කොටස් දෙකෙහි | විභාග ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| නිකුත් කර නොතිබුණු අතර පවත්වන ලද විභාග 03 කට අදාළ ප්‍රතිඵල නිකුත් කිරීමට වසර 1 කට ආසන්න කාලයක් ප්‍රමාද වී තිබුණි. | ලකුණු ඒකාබද්ධ කර ප්‍රතිඵල සකස් කරනු ලබයි.මෙම කොටස්වල ලකුණු ලැබීමේ ප්‍රමාදය ප්‍රතිඵල සැකසීම ප්‍රමාදයට හේතු වී ඇති බවත් සියලුම පාඨමාලාවල ප්‍රතිඵල ශ්‍රේණිගත (GPV/GPA) ක්‍රමයට නිකුත් කිරීම මෙම වර්ෂයේදී ආරම්භ විය.විභාග පැවැත්වීමෙන් පසු ප්‍රතිඵල නිකුත් කිරීමේදී හෝ ප්‍රතිඵල සැකසීමේදී ඇගයීම් පටිපාටිවල යම් නොගැලපීම් ඇතිවුයෙන් අදාළ දෙපාර්තමේන්තු මගින් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය හා ආයතන සභාව වෙත නැවත ඉදිරිපත් කර ලබා දී ඇති උපදෙස් අනුව සංශෝධනය කර අනුමත කර ගැනීමට සිදු වීම නිසා ද ප්‍රමාදවීම් ඇති වු බව. | |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------------ | ------------ |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 වගන්තිය ප්‍රකාරව සියළුම ලංසු කරුවන්ගෙන් ලංසු සුරක්ෂණ ලබා ගත යුතු වුව ද රු.765,072 ක වියදමින් පරිගණක ශාලාව සඳහාත් රු.1,277,460 ක | මෙම කාර්යයන් සඳහා අතපසුවීමකින් ලංසු සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කර නොමැති නමුත් මේ වන විට එම කාර්යය සාර්ථකව අවසන් කර ඇති බවත් ඉදිරි මිල ගණන් කැඳවීමේ දී ලංසු සුරක්ෂණ ලබා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වියදමින් අන්තර්කරණ දෙපාර්තමේන්තු සඳහාත් වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමේ ප්‍රසම්පාදනයන්හිදී ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. | ගැනීමට කටයුතු කරනු ලබන බව | |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2008 වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.27,848,100 ක් වූ ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරිම වෙනුවෙන් සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරිම් සඳහා වූ උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් එනම් රු.1,200,949 ක් ගෙවා වසර 10 ගතවී තිබුණ නමුත් එහි ඉදි කිරිම් කටයුතු 2018 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. | ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතිය ඉදි කිරිම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය 2018.11.14 දින අත්සන් තබා ඇති අතර 2018.12.21 දින ප්‍රදාන ලිපියට අත්සන් තබා ඇති බවත් ගිවිසුම 2019.01.29 දින අත්සන් තබා ඇති අතර මේ වන විට එහි අලුත් වැඩියා කටයුතු සිදු කරමින් පවතින අතර සියයට 40 ක භෞතික ප්‍රගතියක් ලබා ඇති බව. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැය ගත පුනරාවර්තන වියදම් තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 5.7 සිට සියයට 3,303 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අය වැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය. | අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ නිවැරදිව ගණනය කිරීම් සිදු කර අයවැය ලේඛනය සකස් කර , පසුව සිදුවන වෙනස් වීම් සලකා බලා අදාළ සංශෝධන සිදු කරනු ලැබුව ද වියදම් ගිණුම් ගත කිරීමේදී සිදුවන දෝෂ හේතුවෙන් විශාල විචලනයන් පෙන්නුම් කෙරේ.සැලසුම් හා මුදල් දෙපාර්තමේන්තු වලට මෙම වැරදි අවම කර ගැනීමට උපදෙස් ලබා දී ඇති බව | අයවැය සකස් කිරීමේදී වාර්ෂිකව ඉටුකල යුතු ප්‍රමුඛතා නිශ්චිතව හඳුනා ගත යුතු අතර අපේක්ෂිත පරිදි එම කාල වකවානු තුළ ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**4.2** **තිරසාර සංවර්ධන අරමුණු**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ------------ |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව" සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතු අතර ඒ පිළිබඳව 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත සම්මත කර චක්‍රලේඛ මගින් සියලු රජයේ ආයතන දැනුවත් කර තිබුණි. ඒ අනුව , තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව සියළුම රාජ්‍ය ආයතන දැනුවත් විය යුතු වුව ද ආයතනය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් ඒකී කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුතු කල යුතුය. |